ගැනුම් කළමනාකරුවන්ගේ
දර්ශකය
**නොවැම්බර් 2020**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

**2020 නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ ගිය අතර, සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉකුත් මාසයට වඩා වැඩි වුවද එය තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**


**57.6**

**2020 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 17.3ක ඉහළ යෑමක්**

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ඔක්තෝම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 17.3කින් ඉහළ යමින් 2020 නොවැම්බර් මාසයේ දී 57.6ක අගයක් වාර්තා කරන ලදී**. විශේෂයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ නව ඇනවුම් වල දක්නට ලැබුණු සැලකිය යුතු ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද. රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ ද්‍රව්‍යය නිෂ්පාදන අංශයන්හි ඇතුළුව නිෂ්පාදන උප දර්ශකය ඉහළ යාම සහ සියලුම නිෂ්පාදන අංශයන්හි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයෙහි සිදුවූ ඉහළ යාම ද නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ඉහළ යාම කෙරෙහි හේතු විය.

ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සඳහා සැලකියයුතු ඉල්ලුමක් පැවතියද, සෞඛ්‍යය හා සම්බන්ධ ගැටළු හේතුවෙන් අඩු සේවක සංඛ්‍යාවක් නිෂ්පාදන ක්‍රියාවලියට යොදවා ගැනීමට සිදුවීම හේතුවෙන් අපේක්ෂිත ධාරිතාවයෙන් නිෂ්පාදනය සිදු කිරීමට නොහැකි වූ බව එම නිෂ්පාදන අංශවල සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **40.3** | **57.6** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 43.3 | 61.8 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 30.3 | 52.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 25.8 | 48.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 37.1 | 47.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 72.5 | 77.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදනයේ ඉහළ වර්ධනයක් දක්නට ලැබුණද, පෙර මිලදී ගත් ගැනුම් තොග පැවතීම හේතුවෙන් තොග මිලදී ගැනුම් සුළු වැඩි වීමක් පමණක් වාර්තා කරමින් තවදුරටත් කඩඉම් මට්ටමෙන් පහළ අගයක පැවතුණි. ප්‍රධාන වශයෙන් කොළඹ වරායේ පැවති ප්‍රමාදයන් හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළේ ඔවුන්ගේ නැව් භාණ්ඩ නැවත හරවා යැවීමක් හෝ නැව් සේවා සැපයුම් ආයතන මගින් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමක් සිදුවූ බවයි.

රට තුළ මෙන්ම ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.7 කින් ඉහළ යමින් 2020 නොවැම්බර් මාසයේදී 53.7ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 නොවැම්බර් මාසයේදී යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ චීනයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, ඉන්දියාවෙහි එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තව දුරටත් පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් 1 ආයතනය, 2020 දෙසැම්බර් 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**2020 නොවැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 48.8 දක්වා ඉහළ ගිය ද, එය තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.** ඒ අනුව, පසුගිය මාසයට සාපේක්ෂව 2020 නොවැම්බර් මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් අඩු වේගයකින් පහළ ගිය අතර, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ සේවා නියුක්ති උපදර්ශකවල දක්නට ලැබුණු පහළ යෑම් මේ සඳහා හේතු විය.

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන සහ අධ්‍යාපන උපඅංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමග නව ව්‍යාපාර උපදර්ශකය 2020 නොවැම්බර් මාසයේ දී ඉහළ ගියේය.

සේවා කටයුතුවල පහළ යෑම පාලනය වීමක් පෙන්නුම් කරමින් ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකය ද 2020 නොවැම්බර් මාසයේ දී ඉහළ ගියේය .මූල්‍ය සේවා සහ රක්ෂණ උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් 2020 නොවැම්බර් මාසයේ දී දක්නට ලැබුණි .එසේ වුවද, COVID-19 වසංගතයෙහි දෙවන රැල්ල පාලනය කිරීමට 2020 නොවැම්බර් මාසය ආරම්භයේ දී බස්නාහිර පළාත තුළ නිරෝධායන ඇඳිරි නීතිය පැනවීම සහ ප්‍රාදේශීයව පැනවූ හුදකලා කිරීම් හේතුවෙන් තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහන, නවාතැන් සහ ආහාරපාන සැපයීම යන උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් පහළ ගියේය . එහෙත්, ඇඟලුම් සහ පුද්ගල ආරක්ෂක උපකරණ අපනයනය ඉහළ යෑම හේතුවෙන් තමන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය වූ බව භාණ්ඩ ප්‍රවාහනයෙහි යෙදී සිටින ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී.

හුදකලා කර ඇති ප්‍රදේශවල පදිංචි වී සිටින සේවකයන් සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට සිදු වූ අවහිරතා සමග 2020 නොවැම්බර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව ඉහළ යන ලදී.

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන්ගේ සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම සහ නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන්, 2020නොවැම්බර් මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **41.8** | **48.8** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 40.1 | 50.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 35.7 | 43.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 58.7 | 58.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 39.3 | 39.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 35.2 | 53.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එසේ වුවද, COVID- 19වසංගතයෙහි දෙවන රැල්ලෙහි බලපෑමට ලක් වූ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳව සේවා සපයන්නන්ගේ සුභවාදී අදහස් හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2020 නොවැම්බර් මාසයේ දී සැලකියයුතු ලෙස ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**48.8**

**2020 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.0ක ඉහළ යෑමකි.**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

අඛණ්ඩව පස්වන මාසයටත් ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ඔක්තෝබර් මාසයේ පැවති 52.9 සිට 2020 නොවැම්බර් මාසයේ දී 52.2 දක්වා පහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 නොවැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 දෙසැම්බර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.